පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත

மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்

DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
11

අවසාන වාර පරීක්ෂණය - 2022

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I,II

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : ....

කාලය පැය 3යි මිනිත්තු 10 යි

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය I

සියලුම ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

පහත සඳහන් සිද්ධිය ඇසුරෙන් ප්‍රශ්න අංක 1 සිට 5 තෙක් ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු සපයන්න

ආහාර තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාධාරියෙක් වූ වසන්ත ප්‍රාග්ධනය යොදා තම ප්‍රදේශයේ ඇඟළුම් කර්මාන්ත ශාලාව අසල ගොඩනැගිල්ලක් මිලට ගෙන "HOT FOOD" නමින් බේකරියක් සහ අලෙවි සැලක් ආරම්භ කරන ලදි.

1. මෙම සිද්ධියේ සඳහන් අවශ්‍යතා සපුරා ගන්නා විවිධ ස්වරූප කිනම් නමකින් හැඳින්වේද?
   1) වෙළඳාම 2) වුවමනා 3) ආහාර 4) පාන් හා බනිස්

2. ඉහත සඳහන් "HOT FOOD" ව්‍යාපාරය ඇඟළුම් කර්මාන්ත ශාලාව අසල පිහිටා තිබීම ව්‍යාපාරයට
   1) තර්ජනයකි 2) ශක්තියකි 3)අවස්ථාවකි 4) දුර්වලතාවයකි

3. මෙම ව්‍යාපාරය ලියාපදිංචි කිරීමට අවශ්‍ය නම් එය ආරම්භ කර දින කීයක් ඇතුලත ව්‍යාපාරය ලියාපදිංචි කල යුතුද?

   1) 07යි 2) 10 යි 3) 14යි 4) 21 යි

4. මෙම ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා මිලදී ගත් ගොඩනැගිල්ල අයත් වන නිෂ්පාදන සාධකය කුමක්ද?
   1) භූමිය 2) ශ්‍රමය 3) ප්‍රාග්ධනය 4) ව්‍යවසායකත්වය

5. මෙම සිද්ධියේ සඳහන් "HOT FOOD" ව්‍යාපාරය සම්බන්ධ නිවැරදි ප්‍රකාශය තෝරන්න

   1) මෙය භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයකි
   2) මෙම ව්‍යාපාරයට නීතිමය පුද්ගලභාවයක් ඇත
   3) මෙය සේවා සැපයීමේ ව්‍යාපාරයකි
   4) මෙම ව්‍යාපාර නාමය ලියාපදිංචි කිරීම අනිවාර්ය නොවේ

6. ව්‍යාපාරයක ....1.................. අඛණ්ඩව ඇණවුම් ලබා ගැනීමට උනන්දුවක් දක්වන අතර ....2.................සමාජ සුභසාධනයට දායක වන්නේ දැයි විමසා බැලීමට උනන්දුවක් දක්වයි.

   1) තරඟකරුවෝ , ආයෝජකයෝ 2) සැපයුම්කරුවෝ, ප්‍රජාව
   3) සැපයුම්කරුවෝ, අයිතිකරුවෝ 4) ප්‍රජාව, ගනුදෙනුකරුවෝ

7. ඒක පුද්ගල ව්‍යාපාර, හවුල් ව්‍යාපාර, සමිති යන සංවිධාන වර්ග 3 ට ම පොදු ගුණාංග ඇතුලත් පිළිතුර වනුයේ

   1) අසීමිත වගකීම, අයිතිකරුවන් පාලනය කිරීම, පෞද්ගලික අංශයට අයත් වේ
   2) පෞද්ගලික අංශයට අයත් වීම, අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම
   3) ලාභ අරමුණු කර ගැනීම, නෛතික පුද්ගලභාවය සහිත වීම, ගිණුම් තැබීම අනිවාර්යය නොවීම
   4) අයිතිකරුවන් පාලනය කිරීම, ලාභ අරමුණු කර ගැනීම, රජයේ පාලනයෙන් නිදහස් වීම

8. රජයේ දෙපාර්තමේන්තුවක් ක්‍රියාත්මක වනුයේ
   1) සංස්ථාවක් යටතේය 2) අමාත්‍යාංශයක් යටතේය
   3) පෞද්ගලික අංශය යටතේය 4) රාජ්‍ය සමාගමක් යටතේය

9. ඉතිරි බැංකු ගිණුමේ ඇති ශේෂය දක්වා පමණක් ගෙවීම් කල හැකි විද්‍යුත් මුදල් කාඩ්පත වනුයේ

1) හරපත
2) පෙර ගිණුම් කාඩ්පත
3) ණයපත
4) ඇමරිකන් එක්ස්ප්‍රස්

10. රක්ෂණය සම්බන්ධයෙන් පහත සඳහන් ප්‍රකාශ අතුරින් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

1) දේපල රක්ෂණයේදී එම දේපලේ නීත්‍යානුකූල අයිතිකරුට රක්ෂණ හිමිකමක් ඇත
2) පුද්ගලයෙකුට සිය දරුවන් පිලිබඳ රක්ෂා හිමිකමක් ඇත
3) තමන් උකසට ගත් වාහනයක් පිළිබඳ රක්ෂා හිමිකමක් උකස්කරුට ඇත
4) ණයදුන් අයෙකුට දෙන ලද ණය ප්‍රමාණය දක්වා ණය ලබාගත් තැනැත්තාගේ ජීවිතය සම්බන්ධ රක්ෂා හිමිකමක් ඇත.

11. ශ්‍රී ලංකාවට බොරතෙල් ප්‍රවාහනය කරන නෞකාවකට අදාල ප්‍රවාහන මූලිකාංග සඳහා නිදසුන් දැක්වෙන පිළිතුර තෝරන්න.

1) ජල මාර්ග, ගුවන්තොටුපල, ඩීසල්
2) ඩීසල්, වරාය, මහාමාර්ග
3) වරාය, ගුවන් මාර්ග, ඩීසල්
4) ඩීසල්, ජල මාර්ග, වරාය

12. පාසලේ පැවැත්වූ වාණිජ දිනය සිදු කිරීමේදී අනුගමනය කල පියවරයන් කිහිපයක් X තීරුවේ ද කළමනාකරණ කාර්යයන් Y තීරුවේ ද දැක්වේ.

X	Y
1) වාණිජ දිනය සඳහා තේමාවක්. දිනය හා වේලාව තීරණය කිරීම	(A) සැලසුම්කරණය
2) වාණිජ දිනය අවසානයේ දී සාර්ථකත්වයට බලපාන කරුණු පිළිබඳ වාර්තාවක් සැකසීම.	(B) සංවිධානකරණය
3) කමිටු නායකයින් තම සාමාජිකයන් අදාල කාර්යයෙහි යෙදවීම	(C) මෙහෙයවීම
4) අවශ්‍ය මුදල් හා සම්පත් ලබාදීම	(D) පාලනය

පියවරයන්ට අදාළ කළමනාකරණ කාර්යය නිවැරදිව දක්වා ඇති පිළිතුර වනුයේ

1) 1-A , 2-C, 3-B, 4-D
2) 1-B, 2-A, 3-C, 4-D
3) 1-A, 2-D, 3-C, 4-B
4) 1-B, 2-C, 3-D, 4-A

13. පහත දැක්වෙන කරුණු අතරින් පාලනය යන්නට ඇතුළත් කළ නොහැක්කේ කුමක්ද?

1) සැලසුම් කළ පරිදි ගුණාත්මයෙන් යුතු නිවාස ඉදිකර ඇති දැයි සොයා බැලීම
2) සැලසුම් කළ පරිදි නිෂ්පාදන කටයුතු සිදු නො වී ඇත්නම් එයට හේතුව සොයා බැලීම
3) සැලසුම් කළ පරිදි නිෂ්පාදන කටයුතු සිදු නොවී ඇති අවස්ථාවක එය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය කටයුතු සිදු කිරීම
4) සැලසුම් කරන ලද නිෂ්පාදන බිහි කිරීම සඳහා වැඩ කටයුතු බෙදාහැරීම

14. ලෝක ළමා දිනයේ දී එක්තරා වාණිජ බැංකුවක් විසින් අළුතින් ආරම්භ කරන ලද සෑම ළමා ගිණුමකට ම වටිනා තෑගි ලබාදීමට කටයුතු කිරීම අලෙවිකරණ මිශ්‍රයේ කුමන විචල්‍යයට අයත් වේද?

1) නිෂ්පාදිත
2) මිල
3) ස්ථානය
4) ප්‍රවර්ධනය

15. පහත දෑ අතුරින් ඉලක්ක වෙළෙඳපොල යන්න සඳහා නිදසුනක් නොවන්නේ

1) රෙදි සෝදන සබන් කැල්ලක් අලෙවි කිරීම
2) දියවැඩියා රෝගීන් සඳහා විශේෂිත වූ ආහාර නිෂ්පාදනය අලෙවි කිරීම
3) අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය හදාරන සිසුන්ට ආදර්ශ ප්‍රශ්න පත්‍ර පොතක් මුද්‍රණය කර අලෙවි කිරීම
4) තරුණ තරුණියන් සඳහා ඉතිරි කිරීමේ ගිණුමක් හඳුන්වා දීම

16. අනුර තමා ඉතිරි කරගත් මුදලක් ආයෝජනය කිරීමට අදහස් කරයි. ඔහුගේ අපේක්ෂාව පහත පරිදිවේ

❖ මාස හයක දී ආයෝජන මුදල් ආපසු ලබා ගැනීම
❖ ආයෝජනය සඳහා පූර්ණ ආරක්ෂාවක් ලබා ගැනීම
❖ අවදානම අවම කර ගැනීම

අනුරට වඩාත් සුදුසු ආයෝජන මාර්ගය වනුයේ

1) සාමාන්‍ය කොටස් මිලදී ගැනීමය
2) දේපළ මිලදී ගැනීමය
3) ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත් කිරීමය
4) භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමය

17. මූලික ගිණුම්කරණ සමීකරණය නිවැරදිව දැක්වෙන පිළිතුර තෝරන්න

1) වත්කම් + හිමිකම් = වගකීම්
2) හිමිකම් - වගකීම් = වත්කම්
3) වත්කම් + වගකීම් = හිමිකම්
4) වත්කම් - වගකීම් = හිමිකම්

18. ව්‍යාපාරයකට බඩු තොගයක් ණයට ගැනීමෙන් එම ව්‍යාපාරයේ

1) වත්කම් හා වියදම් වැඩිවේ
2) වත්කම් හා ප්‍රාග්ධනය වැඩිවේ
3) වත්කම් හා වගකීම් වැඩිවේ
4) වත්කම් වැඩිවී වගකීම් අඩුවේ

19. ද්‍රවශීලතාව වැඩි වත්කමේ සිට අඩු වත්කම දක්වා අනුපිළිවෙලින් දැක්වෙන්නේ

1) බඩුතොග, ණයගැතියෝ, බැංකු මුදල්, මුදල්
2) මුදල්, ණයගැතියෝ, බඩුතොග, බැංකු මුදල්
3) මුදල්, බැංකු මුදල්, ණයගැතියෝ, බඩු තොග
4) බඩු තොග, මුදල්, ණයගැතියෝ, බැංකු මුදල්

20. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සඳහා ගිණුම් පියවන දිනයේදී ඉදිරියට ගෙන යන ශේෂ දැක්වෙන ගිණුම් ඇතුළත් කාණ්ඩය වන්නේ,

1) ලිපි ද්‍රව්‍ය, රක්ෂණ ගාස්තු, පොලී ආදායම්
2) වරිපනම් ගාස්තු, ගැනිලි, ගැනුම් ගිණුම
3) බැංකු ණය ගිණුම, විදුලි ගාස්තු ගිණුම, විකුණුම් ගිණුම
4) ගොඩනැගිලි ගිණුම, ප්‍රාග්ධන ගිණුම, ලැබිය යුතු කුලී ආදායම් ගිණුම

21. ලෙජරය යනුවෙන් හැඳින්වෙන්නේ

1) ද්විත්ව සටහන් ගිණුම් තැබීමේ ප්‍රධාන පොත
2) මූලික සටහන් පොත් වලින් එකකි
3) දෛනිකව සිදුවන සියලු ගණුදෙනු සටහන් කරනු ලබන පොත
4) වෙනත් මූලික සටහන් පොතක නොලියවෙන ගණුදෙනු ලියන පොත

❖ පහත X තීරයේ මූලික සටහන් පොත් ද Y තීරුවෙන් මූලාශ්‍ර ලේඛන ද දැක්වේ

X තීරුව	Y තීරුව
1) මුදල් පොත	A ගෙවීම් වවුචර
2) බැංකු ගිණුම	B විකුණුම් ඉන්වොයිසිය
3) විකුණුම් ජ'නලය	C ලදුපත
4) පොදු ජ'නලය	D ජ'නල් වව්චරය

22. X තීරයේ මූලික සටහන් පොත් Y තීරුවෙන් මූලාශ්‍ර ලේඛන සමග අනුපිළිවෙළින් ගැළපූ විට ලැබෙන පිළිතුර වන්නේ

1) A D B C
2) C A B D
3) C B A D
4) A C D B

23. ද්විත්ව කාර්යයන් ඉටුකරන මූලික සටහන් පොත් දැක්වෙන්නේ
1) විකුණුම් ජ'නලය හා මුදල් පොත
2) බැංකු ගිණුම හා මුදල් පොත
3) ගැනුම් ජ'නලය හා බැංකු ගිණුම
4) මුදල් පොත හා පොදු ජ'නලය

24. ණය හිමියෙකුට රු.20 000 ක ණය පියවීමේදී 5% ක වට්ටමක් ලැබුණි. ලද වට්ටම් වලට අදාල ද්විත්ව සටහන් වන්නේ
1) මුදල් පොත හර 1000
   ලැබූ වට්ටම් ගිණුම බැර 1000
2) ණයහිමි ගිණුම හර 20 000
   මුදල් පොත බැර 19 000
   ලද වට්ටම් ගිණුම බැර 1000
3) ණයහිමි ගිණුම හර 1000
   ලද වට්ටම් ගිණුම බැර 1000
4) ණයහිමි ගිණුම හර 19 000
   මුදල් පොත බැර 19 000

25. චතුරංගගේ ව්‍යාපාරයේ 2022.03.31 දිනට සුළු මුදල් පොතේ ශේෂය රු.370ක් වූ අතර 2022.4.1 දින රු. 630කින් අග්‍රිමය ප්‍රතිපූර්ණය කරන ලදී. මැයි මාසයේ සිට අග්‍රිමය රු. 500 කින් වැඩි කිරීමට තීරණය කළේ නම් නව සුළු මුදල් අග්‍රිමය කොපමණද ?

1. රු.1500 2. රු. 1000 3. රු. 1130 4. රු. 630

26. සුමිනුගේ ව්‍යාපාරයට 2023.01.12 දින භාණ්ඩ විකුණුම් වලින් රු. 18 000 ක චෙක්පතක් ලැබී තිබූ අතර එය එදිනම බැංකුවේ තැන්පත් කිරීමට නොහැකි විය. මෙම ගණුදෙනුවට අදාල ද්විත්ව සටහන වන්නේ

1) බැංකු ගිණුම හර 18000
   විකුණුම් ගිණුම බැර 18000
2) බැංකු ගිණුම හර 18000
   මුදල් ගිණුම බැර 18000
3) මුදල් ගිණුම හර 18000
   බැංකු ගිණුම බැර 18000
4) මුදල් ගිණුම හර 18 000
   විකුණුම් ගිණුම බැර 18 000

27. මේනකගේ ව්‍යාපාරයේ 2023.1.31 දිනට බැංකු ගිණුමේ ශේෂය රු. 25 000 ක් වූ අතර එදිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය රු.22 000 ක් විය. මෙම වෙනසට හේතුවන ගණුදෙනුව වන්නේ
1) ණය ගැතියන්ගෙන් සෘජුවම බැංකුවට ලැබී ඇති මුදල් රු. 3000
2) නිකුත් කළ නමුත් ගෙවීමට ඉදිරිපත් නොවූ චෙක්පත් රු. 3000
3) බැංකුවට සෘජුවම ලැබී ඇති ආයෝජන ආදායම් රු. 3000
4) ස්ථාවර නියෝග මත බැංකුව ගෙවා ඇති රක්ෂණ ගාස්තු රු. 3000

28. දිනිතිගේ ව්‍යාපාරයේ ගිණුම්කරණ ක්‍රියාවලියේ දී සිදු වූ වැරදි කිහිපයක් පහත දැක්වේ .
   A. රු. 15 000 ක ණයට ගැණුම් ඉන්වොයිසියක් රු. 1500 ක් ලෙස ගැණුම් ජ'නලයේ සටහන් වීම.
   B. රු. 4000 ක රක්ෂණ ගාස්තු ගෙවීම මුදල් පොතේ පමණක් සටහන් වීම
   C. රු. 18 000 ක විකුණුම් ඉන්වොයිසියක් ගිණුම් පොත්වල දෙවරක් සටහන් වීම
   D. ණය ගැතියෙකුගෙන් ලද රු. 8000 ක් මුදල් පොතට හර කර ණයගැති ගිණුමට ද හර කිරීම

   ඉහත ගණුදෙනු තුලින් ශේෂ පරික්සුමේ අසමානතාවයට බලපෑමක් ඇති කරන වැරදි ඇතුලත් කාණ්ඩය වන්නේ

   1) A හා B
   2) B හා D
   3) A හා C
   4) C හා D

29. අරුණ ක්‍රීඩා සමාජයේ 2022.01.01 දිනට සිටි සාමාජික සංඛ්‍යාව 150කි. එක් අයකුගේ මාසික සාමාජික ගාස්තුව රු.100 කි. 2022 වර්ෂය තුළදී සාමාජිකයන් 20 දෙනකු වර්ෂයට අදාළ සාමාජික මුදල් ගෙවා නැත.

   ඉහත ක්‍රීඩා සමාජය සම්බන්ධ වැරදි ප්‍රකාශය තෝරන්න
   1) 2022 වර්ෂයේ ලැබීම් හා ගෙවීම් ගිණුමේ දැක්වෙන සාමාජික මුදල රු. 156 000 කි
   2) සමිතියේ මාසික සාමාජික මුදල් ආදායම 15 000 කි
   3) 2022 වර්ෂයේ සමිතියේ හිඟ සාමාජික මුදල රු. 2000 කි
   4) 2022 වර්ෂයේ ආදායම් ප්‍රකාශයේ දැක්වෙන සාමාජික මුදල් ආදායම රු . 180 000 කි

❖ පහත සඳහන් තොරතුරු ඇසුරෙන් අංක 30 හා 31 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

කාන්තා බෑග් නිෂ්පාදන ආයතනයක් වන "දෙව්මි පැෂන්" ව්‍යාපාරයේ 2023 ජනවාරි මාසයේ ප්‍රාථමික පිරිවැය රු . 100 000 ක් ද නිෂ්පාදන පොදු කාර්ය පිරිවැය රු. 150 000 ක් ද විය. එම මාසයේ නිපදවන ලද බෑග් සංඛ්‍යාව 100 කි. බෑග් එකක නිෂ්පාදන පිරිවැය මත 10% ක ලාභාන්තිකයක් තබා ගනී.

30. දෙව්මි පැෂන් ව්‍යාපාරයේ මුළු නිෂ්පාදන පිරිවැය සහ ඒකකයක පිරිවැය පිලිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   1) රු. 250 000 සහ රු. 1500
   2) රු. 150 000 සහ රු. 1500
   3) රු. 250 000 සහ රු. 2500
   4) රු. 100 000 සහ රු. 1000

31. දෙව්මි පැෂන් ව්‍යාපාරයේ කාන්තා බෑගයක විකුණුම් මිල වනුයේ
   1) රු. 1650
   2) රු. 2500
   3) රු. 1100
   4) රු. 2750

❖ පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 32 හා 33 ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

ගයාන් සංජීවගේ ව්‍යාපාරය සතු ලොරි රථයක් 2021.01.01 දින රු. 25 000ක මාසික කුලියකට බාහිර පාර්ෂවයකට ලබා දී ඇත. මාස 09ක කුලී පමණක් 2021.12.31 දින වන විට ලැබී තිබුණි.

32. 2021.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කළ ලාභ හෝ අලාභ ප්‍රකාශයේ සටහන් කළ යුතු කුලී ආදායම කොපමණද?
   1) රු. 300 000
   2) රු. 75 000
   3) රු. 225 000
   4) රු. 25 000

33. ගයාන් සංජීවගේ ව්‍යාපාරයේ 2021.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ උපචිත කුලී ආදායම ලෙස සටහන් කරනුයේ

1) ජංගම වගකීම් යටතේ රු. 75 000 කි
2) ජංගම වත්කම් යටතේ රු. 225 000 කි.
3) ජංගම වත්කම් යටතේ රු. 75 000 කි.
4) ජංගම වත්කම් යටතේ රු. 300 000 කි.

34. මියුරුගේ ව්‍යාපාරය 2021.01. 01 දින රු. 600 000 ක් වටිනා මොටර් රථයක් මිලදී ගත් අතර එහි ඵලදායි ජීවිත කාලය වර්ෂ 5කි. එම කාලය අවසානයේ මෝටර් රථයේ සුන්බුන් අගය රු. 100 000 කි. 2022. 12. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ දැක්විය යුතු මෝටර් රථ වල ධාරණ අගය කොපමණ ද?

1) රු. 500 000 2) රු. 400 000
3) රු. 300 000 4) රු. 360 000

- පහත සඳහන් තොරතුරු උපයෝගී කරගෙන අංක 35 සිට 40 තෙක් ප්‍රශ්න වලට පිළිතුරු සපයන්න

නිශා 2022. 01. 01 දින රු. 500 000 ක් යොදා ආරම්භ කළ වෙළෙද ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පුහුණු වන ගිණුම් ලිපිකරු විසින් පිළියෙල කළ මූල්‍ය ප්‍රකාශ පහත දැක්වේ.

ලාභ හෝ අලාභ ප්‍රකාශය

විකුණුම්	350 000	
ආයෝජන ආදායම්	10 000	360 000
(-) වියදම්		
ගෙවල් කුලී	15 000	
රක්ෂණ ගාස්තු	20 000	
ගැණුම්	150 000	
දුරකථන ගාස්තු	10 000	
දුන් වට්ටම්	5 000	
ගෙන ඒමේ කුලී	15 000	
ආරම්භක තොග	30 000	
ගෙන යාමේ කුලී	4 500	(249 500)
ශුද්ධ ලාභය		110 500

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

වත්කම්	
ඉඩම් ගොඩනැගිලි	400 000
ලී බඩු උපකරණ	200 000
ලැබිය යුතු ආයෝජන ආදායම්	2 000
මුදල් හා බැංකු ශේෂය	98 000
	700 000
හිමිකම් හා වගකීම්	
ප්‍රාග්ධන	500 000
+ශුද්ධ ලාභය	110 500
බැංකු ණය	70 000
ණයහිමියෝ	16 500
උපචිත ගෙවල් කුලි	3 000
	700 000

35. නිශාගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා විකුණුම් පිරිවැය වන්නේ

1) රු. 195 000 2) රු. 165 000
3) රු. 199 500 4) රු. 184 500

36. 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මෙම ව්‍යාපාරයේ දළ ලාභය වනුයේ

1) රු. 165 000 2) රු. 210 000
3) රු. 200 000 4) රු. 155 000

37. මෙම ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා පිළියෙල කරන ලාභ හෝ අලාභ ප්‍රකාශයේ දැක්විය යුතු පරිපාලන වියදම් වල එකතුව වනුයේ

1) රු. 50 000 2) රු. 30 000
3) රු. 45 000 4) රු. 35 000

38. මෙම ව්‍යාපාරයේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය තුළ දී මුදලින් ගෙවා ඇති ගෙවල් කුලී ප්‍රමාණය කොපමණද?

1) රු. 18 000 2) රු. 15 000
3) රු. 12 000 4) රු. 3 000

39. මෙම ව්‍යාපාරයේ 2022. 01. 01 දින සිට 2022. 12. 31 දිනට හිමිකමේ වැඩි වීම වන්නේ

1) රු. 610 500 2) රු. 110 500
3) රු. 330 000 4) රු. 98 000

40. මෙම ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට ජංගම වත්කම් හා ජංගම වගකීම් පිළිවෙලින් දැක්වෙන පිළිතුර තෝරන්න

1) රු. 100 000 හා රු. 89 500 2) රු. 700 000 හා රු. 89 500
3) රු. 195 00 හා රු. 100 000 4) රු. 100 000 හා රු. 19 500

ව්‍යාපාර හා ගිණුම්කරණ අධ්‍යයනය II

උපදෙස් : පළමුවන ප්‍රශ්නය ඇතුළුව I කොටසෙන් ප්‍රශ්න දෙකක් ද, II කොටසෙන් ප්‍රශ්න දෙකක් ද බැගින් තෝරා ගෙන ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න

01. පහත සිද්ධිය ඇසුරෙන් අංක (I) සිට (X) දක්වා ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න

සචින්ත උසස් පෙළ දක්වා අධ්‍යාපනය හදාරා පසුව ජාතික ආධුනිකත්ව හා පුහුණු අධිකාරිය (NAITA) විසින් පවත්වනු ලබන පරිගණක නිර්මාණකරණය (Graphic Disign) පිළිබඳ පාඨමාලාවක් හදාරන ලදී. පසුව රැකියාවක් කිරීමට වඩා තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීමේ ආශාවෙන් සිටි ඔහු තමා ඉතිරි කරගත් රු. 200000 ක මුදල සහ පියාගෙන් ලබාගත් රු. 300000 ක මුදල ද යොදා රු. 10000 ක මාසික කුලියට නගරයෙන් ලබාගත් ගොඩනැගිල්ලක "සචින් ප්‍රින්ටර්ස්" නමින් ව්‍යාපාරයක් ආරම්භ කරන ලදී.

ඉතා සාර්ථකව ව්‍යාපාරය පවත්වාගෙන ගිය ඔහුගේ ව්‍යාපාරයේ ප්‍රධානතම ගනුදෙනුකරුවන් වූයේ ප්‍රදේශයේ උපකාරක පන්ති පවත්වන ගුරුවරුන්ය. වර්තමානයේ කඩදාසි සඳහා බදු වැඩි කිරීම නිසා කඩදාසි මිල ඉහලයාම, වෙළඳපලේ කඩදාසි හිඟ වීම වැනි තත්වයන්ට ද ඔහුට මුහුණ දීමට සිදු වූ නමුත් අඛණ්ඩව ව්‍යාපාරය ඉදිරියට කරගෙන යන ලදි.

2022 ජනවාරි මාසයේ සිදු වූ ගනුදෙනු පහත දැක්වේ.

01/01 ප්‍රාග්ධනය යොදා ව්‍යාපාරය ආරම්භ කිරීම
01/02 රු. 100000 ක් වටිනා යන්ත්‍රයක් මිලදී ගැනීම
01/03 රු. 50000 ක කඩදාසි තොගයක් ලබා ගැනිම
01/04 රු. 25000 ක ප්‍රශ්න පත්‍ර මුද්‍රණය කිරීම
01/05 රු. 15000 ක කාර්යාලීය උපකරණ මිලදී ගැනීම
01/10 රු. 20000 නිබන්ධන මුද්‍රණය කිරීම
01/11 රු. 15000 කඩදාසි තොගයක් ණයට ලබා ගැනීම
01/15 රු. 6000 විදුලි බිලක් ගෙවීම
01/20 රු. 10 000 කඩකුලිය ගෙවීම
01/20 රු. 18000 නිබන්ධන මුද්‍රණය කිරීම

මෙම ව්‍යාපාරයේ මූල්‍ය කටයුතු විධිමත්ව හා පහසුවෙන් කරගෙන යාම සඳහා ජනවාරි මස අවසානයේ ජංගම ගිණුමක් විවෘත කිරීමට සචින්ත බලාපොරොත්තු වේ

I. අ) මෙම ව්‍යාපාරයේ ඉලක්ක වෙළඳපල කුමක් ද?
ආ) ඉලක්ක වෙළඳපල විසින් සපුරා ගනු ලබන මූලික මිනිස් අවශ්‍යතාවය කුමක්ද?

II. මෙම ව්‍යාපාරය තුළ දක්නට ලැබෙන ශක්තියක් හා අවස්ථාවක් නම් කරන්න

ශක්තියක් --.....................................

අවස්ථාවක් - - ....

III. අ) මෙම ව්‍යාපාරයේ කටයුතු විධිමත්ව පවත්වාගෙන යාම සඳහා ජංගම ගිණුමක් ආරම්භ කිරීමට යා යුතු බැංකු වර්ගය නම් කරන්න

ආ) ජංගම ගිණුමක් පවත්වාගෙන යාමෙන් ව්‍යාපාරිකයෙකුට අත්වන වාසි මොනවාද?

IV. අලෙවිකරණ මිශ්‍රයේ විචල්‍යයන් දෙකක් නම් කර ඒ සඳහා සුදුසු උදාහරණ දෙකක් සිද්ධිය ඇසුරෙන් ලියන්න

V. ව්‍යාපාරය ආරම්භ කරන දිනට අදාල ගිණුම්කරණ සමීකරණය වටිනාකම් සහිතව ලියා දක්වන්න.

VI. 01/05 වන දින සහ 01/11 දින සිදුවූ ගනුදෙනු වලට අදාල ද්විත්ව සටහන ලියන්න

VII. මෙම ව්‍යාපාරය විසින් භාවිතා කරනු ලබන මූලික සටහන් පොත් 02ක් නම් කර එම එක් එක් මූලික සටහන් පොතේ සටහන් කරන ගනුදෙනුව බැගින් ඉහත සිද්ධියෙන් උපුටා ලියන්න

VIII. ඉහත සිද්ධියේ 01/25 දින සිදු වී ඇති ගනුදෙනුවට අදාල ලෙජර් ගිණුම් පිළියෙල කරන්න

IX. ජනවාරි මාසයට අදාල මුදල් පොත පිළියෙල කරන්න

X. ජනවාරි මාසයේ ව්‍යාපාරයේ ශුද්ධ ලාභය/ අලාභය ගණනය කරන්න (ලකුණු 02 x 10 = 20 යි)

I කොටස - ව්‍යාපාර අධ්‍යයනය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

02\. I. හවුල් ව්‍යාපාරයක දක්නට ලැබෙන වාසි දෙකක් ලියන්න (ලකුණු 02 යි)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

අ) මිනිස් අවශ්‍යතා ප්‍රාථමික වන අතර වුවමනා සීමිත වේ

ආ) ව්‍යාපාරයක අභ්‍යන්තර පරිසරය අධ්‍යයනය කිරීමෙන් ශක්තීන් සහ දුර්වලතා හඳුනාගත හැක

ඉ) ව්‍යාපාරයක ගොඩනැගිල්ල පිහිටා ඇති ඉඩම නිෂ්පාදන සාධකයක් වන ප්‍රාග්ධනයට අයත් වේ

ඊ) හිමිකාරීත්වය අනුව ව්‍යාපාර සංවිධාන වර්ග කිරීමේ දී සීමිත පොදු සමාගම් රාජ්‍ය අංශයට අයත් වේ

(ලකුණු 02 යි)

III. මෑතක දී පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ අයවැයේ දී පනවන ලද සෙස් බද්ද හේතුවෙන් පාසල් උපකරණ වල මිල ඉහළ යාමක් සිදුවන බව ව්‍යාපාරිකයෝ පවසති.
සෙස් බද්දට අමතරව භාණ්ඩ හා සේවා වල මිල වැඩිවීමට බලපාන ප්‍රධානතම වක්‍ර බද්ද නම් කර එහි වර්තමාන ප්‍රතිශතය දක්වන්න

(ලකුණු 02 යි)

IV. රාජ්‍ය සංස්ථාවක දක්නට ලැබෙන ලක්ෂණ 02 ක් දක්වන්න (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

03\. I. තොග වෙළඳාමේ දක්නට ලැබෙන ලක්ෂණ 04ක් ලියන්න (ලකුණු 02 යි)

II. පහත ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

අ) ජංගම ගිණුම් සඳහා ඉතිරි කිරීමේ ගිණුම්වලට වඩා වැඩි පොලියක් හිමිවේ

ආ) චෙක්පතක චුම්භක තීන්ත අක්ෂර හැඳුනුම් තීරුවේ අංක පිළිවෙල අනුව දෙවනියට ඇත්තේ බැංකුවේ අංකයයි

ඉ) ජීවිත රක්ෂණය සඳහා වැදගත්ම රක්ෂණ මූලධර්මය වනුයේ හානි පූර්ණ මූලධර්මයයි

ඊ) කිසියම් රටක් වෙනත් රටකට භාණ්ඩ විකිණීම අපනයන වෙළඳාම නම් වේ

(ලකුණු 02 යි)

III. කොළඹ සිට අනුරාධපුරයට ඉන්ධන බෙදාහැරීම සඳහා සුදුසුම හා ලාභදායිම මාධ්‍ය නම් කර එහි දක්නට ලැබෙන වාසි 02ක් ලියන්න

(ලකුණු 02 යි)

IV. ගනුදෙනු කටයුතු සඳහා විද්‍යුත් මුදල් භාවිතය සීඝ්‍රයෙන් වැඩිවෙමින් පවතී. විද්‍යුත් මුදල් භාවිතයේ ඇති වාසි හතරක් සඳහන් කරන්න (ලකුණු 02 යි)

(මුළු ලකුණු 08 යි)

04. I. සාමාන්‍ය කොටස් හි ආයෝජනයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ දෙකක් දක්වන්න (ලකුණු 02 යි)

II. පහත සඳහන් ප්‍රකාශ සත්‍ය ද අසත්‍ය ද යන්න දක්වන්න

අ) කලමනාකරණය යනු කාර්යයන් කිහිපයකින් යුතු අඛණ්ඩ ක්‍රියාවලියකි

ආ) පුද්ගලයෙකුට තමාගේ ඕනෑම ඥාතියෙකු රක්ෂණය කිරීමට නීත්‍යානුකූල අයිතියක් ඇත

ඉ) නිෂ්පාදිතයක් පාරිභෝගිකයාට බෙදාහැරීමත් සමඟ අලෙවිකරණ ක්‍රියාවලිය අවසන් වේ

ඊ) රජයේ කෙටිකාලීන මූල්‍ය අවශ්‍යතා ඉටුකරගැනීම සඳහා රජය විසින් නිකුත් කරන කෙටි කාලීන සුරැකුම්පත් ලෙස භාණ්ඩාගාර බිල්පත් දැක්විය හැක. (ලකුණු 02යි)

III. අලෙවිකරණ මිශ්‍රයට අයත් විචල්‍යයන් නම් කර එම එක් එක් විචල්‍යට අයත්වන අයිතම එක බැගින් දක්වන්න (ලකුණු 02යි)

IV. එක්තරා පුද්ගලයෙකු සතුව රු. මිලියනයක් පමණ තිබේ. එම මුදල ආයෝජනය කළ හැකි විවිධ ආයෝජන මාර්ග අතරින් හතරක් නම් කරන්න (ලකුණු 02යි)

(මුළු ලකුණු 08 යි)

II කොටස - ගිණුම්කරණය

(ප්‍රශ්න **දෙකකට** පමණක් පිළිතුරු සපයන්න)

05. (I) අ) වගකීමක දැකිය හැකි ලක්ෂණ දෙකක් ලියන්න

ආ) ලෙජරයේ දැකිය හැකි වගකීම් ගිණුම් දෙකක් ලියන්න (ලකුණු 02යි)

(II) පහත සඳහන් ගණුදෙනු සඳහා ද්විත්ව සටහන් ලියන්න

අ) ණයගැති දිනුකගෙන් ලැබුණු රු 18000 ක චෙක්පත අගරු වූ බව බැංකුව දැනුම් දීම

ආ) ණයහිමි පසිඳුට රු 5000ක් ගෙවීමේ දී ලද වට්ටම රු 500යි (ලකුණු 02 යි)

(III) සන්දේශ්ගේ ව්‍යාපාරයේ 2023.01.01 දිනට පැවති සියලු වත්කම් හා වගකීම් ශේෂ පහත දැක්වේ

ඉඩම් හා ගොඩනැගිලි	1250000
බඩුතොගය	860000
ණයහිමියෝ	120000
මුදල්	250000
බැංකුණය	500000

2023 ජනවාරි පළමු සතිය තුල සිදු වූ ගණුදෙනු පහත දැක්වේ.

1. රු 40000ක බඩු තොගයක් අත්පිට මුදලට ගැනීම
2. රු 20000 ක පිරිවැයක් වූ බඩුතොගයක් රු. 30000 කට ණයට විකිණීම
3. රක්ෂණ ගාස්තු ගෙවීම රු 12000 යි

අවශ්‍ය වන්නේ

අ) ඉහත ගණුදෙනු ගිණුම්කරණ සමීකරණයට බලපාන ආකාරය වටිනාකම් සහිතව දැක්වීම (පිළිතුරු සැපයීමේ දී පහත ආකාරයේ ආකෘතියක් භාවිතා කරන්න)

ගණු දෙනුව	වත්කම්				වගකීම		හිමිකම
ශේෂය	ඉඩම් සහ ගොඩනැගිලි	මුදල්	බඩුතොගය	ණයගැතියෝ	බැංකුණය	ණය හිමියෝ	
1							
2							
3							

ආ) ඉහත ගණුදෙනුවලින් පසු 2023.01.07 දිනට ව්‍යාපාරයේ හිමිකම ගණනය කරන්න (ලකුණු 04යි)

(IV) ඉඳුවර ආකාශ්ගේ ව්‍යාපාරයේ 2023 පෙබරවාරි මාසයේ සුළු මුදල් අග්‍රිමය රු 5000කි. 2023. 01. 31 දිනට සුළු මුදල් ශේෂය රු 750ක් විය. පෙබරවාරි මාසයේ සුළු මුදල් ආශ්‍රිත ගණුදෙනු පහත දැක්වේ.

- 2023 -02 -12 ව. අං 01 පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය මිලදී ගැනීම රු 800
- 2023 - 02 -19 ව. අං 02 ලිපි ලියාපදිංචි ගාස්තු රු 300
- 2023 - 02 - 23 ව. අං -03 නෙසඳුට වැටුප් අත්තිකාරම් ගෙවීම රු. 2000
- 2023 - 02 - 25 ව. අං -04 මුද්දර ලියුම් කවර මිලදී ගැනීම රු. 700
- 2023 - 02 - 27 ව. අං -05 සංග්‍රහ ගාස්තු රු. 300

අවශ්‍ය වන්නේ,

ඉහත ගණුදෙනු සුළු මුදල් පොතේ සටහන් කර, 2023. 02. 28 දිනට සුළු මුදල් පොත තුලනය කර දැක්වීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

06. I. ශේෂ පිරික්ෂුමක හර ශේෂය හා බැර ශේෂය සමාන වීමෙන් තහවුරු කරගත හැකි කරුණු 02ක් ලියන්න (ලකුණු 01 යි)

II. ඔකිත්ගේ ව්‍යාපාරයේ ගිණුම් වර්ෂය 2022-12-31 දිනෙන් අවසන් වේ. එදිනට ගිණුම් තුලනය කල පසු පැවති ශේෂයන් පහත පරිදිවේ.

	රු.
රථවාහන	1 500 000
විකුණුම්	350 000
ගැණුම්	170 000
ලද වට්ටම්	2 000
මුදල් ශේෂය	130 000
ණයගැති	40 000
ණය හිමි	80 000
බැංකුණය	400 000
ප්‍රාග්ධනය	1 000 000

ඉහත ශේෂයන් උපයෝගී කරගෙන වැරදි නිවැරදි කිරිමට ප්‍රථම පිලියෙල කරන ශේෂ පිරිස්සුම පෙන්වන්න (ලකුණු 03 යි)

III. ඔෂානිගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට පිලියෙල කල ශේෂ පිරික්සුමේ හර තීරුව සහ බැර තීරුව සමාන නොවීය. වෙනසට හේතු පහත දැක්වේ

1. රු. 7000ක විකුණුම් ඉන්වොයිසියක් අස්ථාන ගත වී ඇත
2. ලද වට්ටම් රු. 3000ක් දුන් වට්ටම් ගිණුමට හරකර ඇත
3. ගැනිලි ගිණුමේ ශේෂය රු. 5000 ශේෂ පිරික්සුමට උපුටාගෙන නොමැත

අවශ්‍ය වන්නේ

අ) වැරදි නිවැරදි කිරීමට අදාල ජ'නල් සටහන් පෙන්වීම
ආ) අවිනිශ්චිත ගිණුම පිලියෙල කර අවිනිශ්චිත ගිණුමේ ආරම්භක ශේෂය පෙන්වීම

(ලකුණු 04 යි)

IV. ජලනිගේ ව්‍යාපාරයේ 2023 - ජනවාරි මාසයේ බැංකු ගිණුම සහ ජනවාරි මාසයට අදාල බැංකු ප්‍රකාශය පහත දැක්වේ

බැංකු ගිණුම

දිනය	ලදු. අං.	විස්තරය	ස. පි.	වටිනාකම (රු)	දිනය	ච. අං.	විස්තරය	ස. පි.	වටිනාකම (රු)
01/01		ශේෂය ඉ/ගෙ		54 000	01/04		ණයහිමි (308104)		45 000
01/07		මුදල් තැන්පත්		30 000	01/10		ගැනුම් (308105)		12 000
01/ 15		චෙක් තැන්පත් (873402)		23 000	01/17		විදුලිබිල්පත් (308106)		18 000
01/28		චෙක්තැම්පතු (522145)		60 000	01/25		වැටුප් (308107)		20 000
					01/ 31		ශේෂය ප/ගෙ		72 000
				<u>167 000</u>					<u>167 000</u>

බැංකු ප්‍රකාශය

දිනය	විස්තරය	හර (රු)	බැර (රු)	ශේෂය (රු)
01/ 01	ශේෂය ඉ/ ගෙ			54 000
01/ 07	මුදල් තැන්පත්		30 000	84 000
01/ 09	චෙක් තැන්පතු (73154)		11 000	95 000
01/ 10	චෙක් (308104)	45 000		50 000
01/ 17	චෙක් (308106)	18 000		32 000
01/ 20	චෙක් තැන්පතු (823402)		23 000	55 000
01/ 26	චෙක් (308107)	20 000		35 000
01/ 28	රක්ෂණ ගාස්තු ගෙවීම	8 000		27 000
01/ 30	බැංකු ගාස්තු	2 000		25 000

අවශ්‍ය වන්නේ ,

අ) බැංකු ගිණුම සංශෝධනය කිරීම

ආ) 2023. 01. 31 දිනට ව්‍යාපාරයේ බැංකු සැසඳුම් විස්තරය පිළියෙල කිරීම (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

07. I. අ) ලාභ අරමුණු කර නොගත් සංවිධාන වල ලැබීම් සහ ගෙවීම් ගිණුම පිළියෙල කිරීමෙන් ඉටු කර ගත හැකි අරමුණු 2 ක් ලියන්න

ආ) ගැළපුම් සටහන් යන්න හඳුන්වන්න

(ලකුණු 02 යි)

II. “නෙලුම්” කාන්තා සමිතියේ සමාජික සංඛ්‍යාව 50කි, මාසික සාමාජික ගාස්තුව රු. 200කි. 2022 වර්ෂයට අදාල ගණුදෙනු කිහිපයක් පහත දැක්වේ.

සඟරා මුද්‍රණ ගාස්තු	රු. 17 000
සඟරා අලෙවි ආදායම	රු. 30 000
ලිපි ද්‍රව්‍ය වියදම්	රු. 11 800
සාමාජික හිමිකම් ගෙවීම	රු. 40 000
කාර්යාල උපකරණ මිලදී ගැනීම	රු. 16 000

අමතර තොරතුරු

- 2022 ජනවාරි 01 දින මුදල් ශේෂය රු. 43 000කි

- 2022 දෙසැම්බර් මාසයට අදාළව සාමාජිකයින් 15 දෙනෙකු සාමාජික මුදල් ගෙවා නොමැති අතර , ඉතිරි සාමාජික මුදල් සියල්ල මුදලින් ලැබී ඇත.

අවශ්‍ය වන්නේ

"නෙලුම්" කාන්තා සමිතියේ 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලැබීම් සහ ගෙවීම් ගිණුම පිළියෙල කිරීම

(ලකුණු 02 යි)

III. පාරමීගේ ව්‍යාපාරයේ 2022. 12. 31 දිනට ශේෂ පිරික්සුම පහත දැක්වේ.

	හර (රු.)	බැර(රු.)
දළ ලාභය		378 000
ඉඩම් හා ගොඩනැගිලි (පිරිවැයට)	750 000	
මෝටර් රථ (පිරිවැයට)	800 000	
ලී බඩු උපකරණ (පිරිවැයට)	240 000	
ණය ගැතියෝ	60 000	
ණය හිමියෝ		45 000
20% ආයෝජන	300 000	
විදුලි ගාස්තු	12 000	
ප්‍රචාරණ වියදම්	15 000	
මෝටර් රථ ක්ෂය වෙන් කිරීම (2022. 01. 01)		160 000
පරිපාලන වේතන	40 000	
දුන් වට්ටම්	3 000	
ආයෝජන ආදායම්		30 000
12% බැංකු ණය		600 000
ගැනිලි	5 000	
මුදල් ශේෂය	78 000	
බැංකු ශේෂය		25 000
ඉතිරි බඩු තොගය	28 000	
ප්‍රාග්ධනය		1093 000
	2331 000	2331 000

අමතර තොරතුරු

- 2022. 12. 31 දිනට ඉතිරි බඩු තොගය රු. 28 000
- ණයගැතියන්ගෙන් රු. 7000 ක් බොල් ණය ලෙස කපා හරින්න
- ඉඩම් ගොඩනැගිලි, මෝටර් රථ, ලී බඩු උපකරණ, පිරිවැයමත 10% සරල මාර්ග ක්ෂය ක්‍රමයට ක්ෂය කරන්න

අවශ්‍ය වන්නේ

I. 2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභ හෝ අලාභ ප්‍රකාශනය. (ලකුණු 04 යි)

II. 2022. 12. 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය. (ලකුණු 04 යි)

(මුළු ලකුණු 12 යි)

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

ශ්‍රේණිය
11

අවසාන වාර පරීක්ෂණය - 2022

විෂයය :- ....

පාසලේ නම : ....

ඇතුළත්වීමේ අංකය : .... කාලය :

පිළිතුරු
Iකොටස

01	(2)	11	(4)	21	(1)	31	(4)
02	(3)	12	(3)	22	(2)	32	(1)
03	(3)	13	(4)	23	(2)	33	(3)
04	(3)	14	(4)	24	(3)	34	(2)
05	(1)	15	(1)	25	(1)	35	(1)
06	(2)	16	(4)	26	(4)	36	(4)
07	(1)	17	(4)	27	(4)	37	(3)
08	(2)	18	(3)	28	(2)	38	(3)
09	(1)	19	(3)	29	(3)	39	(2)
10	(2)	20	(4)	30	(3)	40	(4)

පිළිතුරු
IIකොටස

01. I (අ) උපකාරක පංති ගුරුවරුන්
(ආ) අධ්‍යාපනය

II ශක්තියක් → පරිඝණක පාඨමාලාවක් හදාරා තිබීම
අවස්ථාවක් → උපකාරක පංති ව්‍යාප්ත වීම

III (අ) වාණිජ බැංකු
(ආ) <u>වාසි</u>

- චෙක්පත් මගින් ගෙවීම් කල හැකි වීම
- බැංකු අයිරා පහසුකම් ලබාගත හැකි වීම
- සෘජු ප්‍රේෂණ රැස් කිරීම
- ස්ථාවර නියෝග ක්‍රියාත්මක කිරීම
- බැංකු ප්‍රකාශය ලැබීම

IV. නිෂ්පාදිතය → නිබන්ධන, ප්‍රශ්න පත්‍ර
මිල → ප්‍රශ්න පත්‍ර මිල, නිබන්ධනවල මිල

V. වත්කම් = හිමිකම + වගකීම්
500000 = 500000

VI. 01/05

කාර්යාලීය උපකරණ ගිණුම හර 15000
  මුදල් පොත බැර 15000

01/11

ගැනුම් ගිණුම හර 15000
  ණයහිමි ගිණුම බැර 15000

VII. මුදල් පොත → ඉහත ගනුදෙනු අතරින් මුදල් පොතේ සටහන් කරන ඕනෑම ගනුදෙනුවක්
ගැනුම් ජ'නලය → කඩදාසි තොගයක් ණයට ගැනීම

VIII.

මුදල් ගිණුම	
01/25 විකුණුම් 18000	

විකුණුම් ගිණුම	
	01/25 මුදල් 18000

IX. මුදල් පොත

දිනය	විස්තරය	වටිනාකම	දිනය	විස්තරය	වටිනාකම
01/01	ප්‍රාග්ධනය	500000	01/02	යන්ත්‍ර	100000
01/04	විකුණුම්	25000	01/03	ගැනුම්	50000
01/10	විකුණුම්	20000	01/05	කාර්යාලීය උපකරණ	15000
01/20	විකුණුම්	18000	01/15	විදුලි වියදම්	6000
			01/20	කඩ කුලිය	10000
		563000			563000

X. විකුණුම් (25000 + 20000 + 18000) = 63000
වියදම් (50000 + 6000 + 10000) = <u>66000</u>
ශුද්ධ අලාභය = <u>(3000)</u> (ලකුණු 02 x 10 = 20 යි)

02. I.

- පහසුවෙන් ආරම්භ කල හැකි වීම
- වැඩි ප්‍රාග්ධනයක් රැස් කරගත හැකි වීම
- හවුල්කරුවන් සතු විවිධ දක්ෂතා ප්‍රයෝජනයට ගත හැකි වීම
- වගකීම් හවුල්කරුවන් අතර බෙදී යාම
- සාමූහික තීරණ ගත හැකි වීම (ලකුණු 02 යි)

II. (අ) අසත්‍යයි (ආ) සත්‍යයි (ඉ) සත්‍යයි (ඊ) අසත්‍යයි ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

III. එකතු කල අගය මත බද්ධ (VAT)

ප්‍රතිශතය → 15% (ලකුණු 02 යි)

IV. • අයිතිය හා පාලනය රජය සතු වීම
• නෛතික පුද්ගලභාවයක් තිබීම
• විශේෂ පනතක් හෝ පවත්නා පොදු පනතක් යටතේ ආරම්භ කළ හැකි වීම
• අඛණ්ඩ පැවැත්මක් තිබීම (ලකුණු 02 යි)

03. I. • නැවත විකිණීමේ අරමුණින් භාණ්ඩ මිලදී ගැනීම
• බොහෝ විට භාණ්ඩ විශාල ප්‍රමාණයක් එකවර විකිණීම
• භාණ්ඩ වර්ග කිහිපයක් පමණක් අලෙවි කිරීම
• සාපේක්ෂව ඒකකයක විකුණුම් මිල අඩු වීම
• බහුලව වෙළඳ වට්ටම් ලබාදීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

II. (අ) අසත්‍යයි (ආ) සත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) සත්‍යයි ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

III. දුම්රිය (ලකුණු 01 යි)
<u>වාසි</u>
• පිරිවැය අඩුවීම
• ධාරිතාව වැඩි වීම ($\frac{1}{2}$ x 2 = ලකුණු 01 යි)

IV. • වේගවත් බව/ ක්ෂණික බව
• අවදානම අඩු වීම
• සියලු තොරතුරු ස්වයංක්‍රීයව වාර්තා වීම
• දවසේ ඕනෑම වේලාවක ගනුදෙනු කළ හැකි වීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

04. I. • මිලදී ගත් කොටස් සඳහා ලාභාංශ ආදායම් ලැබිය හැකි වීම
• ගත් මිලට වඩා වැඩි වටිනාකමකට විකිණීමෙන් ප්‍රාග්ධන ලාභ උපයා ගත හැකි වීම
• ඕනෑම අවස්ථාවක සාමාන්‍ය කොටස් අලෙවි කර මුදල් ලබා ගැනීමට හැකි වීම
• ණය ලබා ගැනීමේ දී ඇප සුරකුම් ලෙස ඉදිරිපත් කළ හැකිවීම
• ඡන්දය භාවිත කර අධ්‍යක්ෂ මණ්ඩලයට තේරී පත්වීමේ හැකියාව (ලකුණු 02 යි)

II. (අ) සත්‍යයි (ආ) අසත්‍යයි (ඉ) අසත්‍යයි (ඊ) සත්‍යයි ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

III. නිෂ්පාදිතය - ගුණත්වය
මිල - ලයිස්තු මිල
ස්ථානය - බෙදාහැරීම
ප්‍රවර්ධනය - ප්‍රචාරණය ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

IV. • ඉතිරි කිරීමේ ගිණුමක මුදල් තැන්පත් කිරීම
• ස්ථාවර තැන්පතුවක් ආරම්භ කිරීම
• දේපළ මිලදී ගැනීම
• කොටස් වල ආයෝජනය කිරීම
• භාණ්ඩාගාර බිල්පත් වල ආයෝජනය කිරීම
• තමාගේම ව්‍යාපාරයක් ආරම්භ කිරීම ($\frac{1}{2}$ x 4 = ලකුණු 02 යි)

05. I. අ) • අතීත ගණුදෙනුවක ප්‍රතිඵලයක් වීම
• වර්ථමාන බැදීමක් පැවතීම
• බේරුම් කිරීමේදී ව්‍යාපාරයේ සම්පත් වලින් කොටසක් පිටතට ගලා යෑම
(කරුණු 2කට ලකුණු 01 යි)

ආ) බැංකු ණය ගිණුම
ණය හිමි ගිණුම
ගෙවිය යුතු වියදම් ගිණුම්
ඉදිරියට ලද ආදායම් ගිණුම්
බැංකු අයිරාවක් සහිත බැංකුගිණුම (වගකීම් ගිණුම් දෙකකට ලකුණු 01 යි)

II. අ) දිනූකගේ ගිණුම හර රු. 18 000
බැංකු ගිණුම බැර රු. 18 000 (ලකුණු 01 යි)

ආ) පසිඳුගේ ගිණුම හර රු. 5 000
ලද වට්ටම් ගිණුම බැර රු. 500
මුදල් පොත බැර රු. 4 500 (ලකුණු 01 යි)

III. අ)

ගණු දෙනුව	වත්කම්				වගකීම		හිමිකම
	ඉඩම් සහ ගොඩනැගිලි	මුදල්	බඩු තොගය	ණයගැතියෝ	බැංකුණය	ණය හිමියෝ	
ශේෂය	1250 000	250 000	860 000		500 000	120 000	1740 000
1		-40 000	+40 000				(ලකුණු 01)
2			-20 000	+30 000			+ 10 000 (ලකුණු 01)
3		-12 000					-12 000 (ලකුණු 01)

ආ) රු. 1 738 000 (ලකුණු 01)

හර සුළු මුදල් පොත බැර

ලැබීම රු.	ස. පි	දිනය	විස්තරය	ව. අං	ගෙවීම් රු.	විශ්ලේෂණ තීරු: පිරිසිදු	තැපැල්	සංග්‍රහ	ලෙජර් ගිණුම්	ලෙ. පි.
750 (½)		02/01	ශේෂය ඉ/ගෙ							
4250		02/01	මුදල්							
		02/12	පිරිසිදු කිරීමේ ද්‍රව්‍ය	01	800	800		(½)		
		02/19	ලිපි ලියාපදිංචි ගාස්තු	02	300		300			
		02/23	නෙසඳුට ගෙවූ වැටුප් අත්තිකාරම්	03	2000				2000	(1)
		02/25	මුද්දර මිලදී ගැනීම	04	700		700		(½)	
		02/27	සංග්‍රහ ගාස්තු	05	300			300		
					4100	800	1000	300	2000	
		02/28	ශේෂය ප/ගෙ		900			(½)		
5000					5000					
900 (1)		03/01	ශේෂය ඉ/ගෙ							

06. I. 1. ගිණුම් වලට හර කර ඇති අගය සහ බැරකර ඇති අගය සමාන බව
2. ගිණුම් නිවැරදිව තුලනය කර ඇතිබව (ගණිතමය නිවැරදිතාව ඇති බව)

(කරුණු 02 ලකුණු 01)

II.

ඔකිත්ගේ ව්‍යාපාරය
2022. 12. 31 වන දිනට ශේෂ පිරික්සුම (½)

විස්තරය	හර (රු)	බැර (රු)
රථවාහන	1500 000	
විකුණුම්		350 000
ගැණුම්	170 000	
ලද වට්ටම්		2 000
මුදල් ශේෂය	130 000	
ණයගැති	40 000	
ණය හිමි		80 000
බැංකුණය		400 000
ප්‍රාග්ධනය		1 000 000
අවිනිශ්චිත ගිණුම		8000 (½)
	1840 000	1840 000

(1) (හර තීරුවේ අගයන්)
(1) (බැර තීරුවේ අගයන්)

III. (අ) පොදු ජ'නලය

දිනය	වවු, අං	විස්තරය	හර(රු)	බැර(රු)
12/31		ණය ගැති ගිණුම හර විකුණුම් ගිණුම (රු. 7000 ක විකුණුම් ඉන්වොයිසියක් අස්ථානගත විමේ වරද නිවැරදි කිරීම)	7 000	7 000 (01)
12/31		අවිනිශ්චිත ගිණුම හර දුන් වට්ටම් ගිණුම බැර ලද වට්ටම් ගිණුම බැර (ලද වට්ටම් රු. 3000 ක් දුන් වට්ටම් ගිණුමට හර කර තිබීමේ වරද නිවැරදි කිරීම)	6000	3000 3000 (01)
12/31		අවිනිශ්චිත ගිණුම (ගැනිලි ගිණුමේ ශේෂය ශේෂ පිරික්සුමට උපුටා නොගැනීමේ වරද නිවැරදි කිරීම)		5000 (01)

ආ) හර

අවිනිශ්චිත ගිණුම

බැර

දිනය	විස්තරය	ලෙ. පි.	වටිනාකම (රු)	දිනය	විස්තරය	ලෙ. පි.	වටිනාකම (රු)
12/31	දුන් වට්ටම් ගිණුම		3000	12/31	ශේෂ පිරික්සුමේ වෙනස		1000 01
12/31	ලද වට්ටම් ගිණුම		3000	12/31	....		5000
			6000				6000

V. (අ)

හර

සංශෝධිත බැංකු ගිණුම

බැර

දිනය	විස්තරය	ලෙ. පි.	වටිනාකම	දිනය	විස්තරය	ලෙ. පි.	වටිනාකම
01/31	ශේෂය		(½) 72 000	01/31	ස්ථාවර නියෝග (රක්ෂණ)		8000 (½)
01/31	සෘජු ප්‍රේෂණ		(½) 11 000	01/31	බැංකු ගාස්තු		2000
01/31	සෘජු ප්‍රේෂණ		23 000				
					ශේෂය ප/ගෙ		96000 (½)
			10 6000				10 6000
	ශේෂය ඉ/ගෙ		96 000				

ආ)

ජලනිගේ ව්‍යාපාරයේ
2023 ජනවාරි මාසයට අදාල බැංකු සැසඳුම් විස්තරය

	රු.	රු.
සංශෝධිත බැංකු ගිණුමට අනුව ශේෂය		96 000
එකතු කළා		
බැංකුවට ඉදිරිපත් නොකල චෙක්	(½)	
308105	12 000	12 000
		108 000
අඩු කළා		
නිෂ්කාශනය නොවූ චෙක්පත්	(½)	
873402	23 000	
522145	(½) 60 000	(83 000)
2023. 01. 31 දිනට බැංකු ප්‍රකාශයට අනුව ශේෂය		25 000 (½)

07. I. අ)

1. කාලච්ඡේදය අවසානයේ මුදල් ශේෂය දැනගත හැකි වීම
2. මුදල් කළමණාකරණය ක්‍රමවත් වීම
3. මුදල් සම්බන්ධ වංචා හා අයතා ගණුදෙනු අවම කල හැකි වීම
4. ආයතන අරමුණු ළගාකරගැනීමට සංවිධානයේ මූල්‍ය සම්පත් මැනවින් යොදාගත හැකි වීම
5. මුදල් ලැබීම් හා ගෙවීම් මාර්ග පිළිබඳ තොරතුරු දැනගත හැකි වීම (කරුණු 2කට ලකුණු 1 යි)

ආ) මූල්‍ය ප්‍රකාශන වලට යොදාගත යුතු නිවැරදි අගයන් ලැබෙනසේ සිදුකල යුතු වෙනස්කම් සඳහා ගිණුම්වල ගලපනු ලබන සටහන් ගැලපුම් සටහන් වේ (ලකුණු 01යි)

II.

නෙලුම් කාන්තා සමිතිය
2022. 12. 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ලැබීම් හා ගෙවීම් ගිණුම

ශේෂය ඉ/ගෙ	43 000	සඟරා මුද්‍රණ ගාස්තු	17 000	
සාමාජික මුදල් (01)	117 000	ලිපි ද්‍රව්‍ය වියදම්	11 800	
සඟරා අලෙවි ආදායම	30 000	සාමාජික හිමිකම් ගෙවීම	40 000	
		කාර්යාල උපකරණ මිලදී ගැනීම	16 000	
		ශේෂය ප/ගෙ	105 200	01
	190 000		190 000	

සාමාජික මුදල්

	200 x 12 x 50	= 120 000
(-)	200 x 15	= (3 000)
		= 117 000

III.

පාරමීගේ ව්‍යාපාරය
2022.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා (½)
ලාභ හෝ අලාභ ප්‍රකාශනය

දළ ලාභය			378 000	
ආයෝජන ආදායම		(½)	60 000	
			438 000	
බෙදා හැරීමේ වියදම්				
මෝටර් රථ ක්ෂය	80 000			
ප්‍රචාරන වියදම්	15 000	(½)		
දුන් වට්ටම්	3 000			
බොල් ණය	7 000	105 000		
පරිපාලන වියදම්				
ඉඩම් හා ගොඩනැගිලි ක්ෂය	75 000	} 01		
ලී බඩු උපකරණ ක්ෂය	24 000			
විදුලි ගාස්තු	12 000			
පරිපාලන වේතන	40 000	151 000		
මූල්‍ය වියදම්	(½)			
බැංකු ණය පොලිය	72 000	72 000	(328 000)	
ශුද්ධ ලාභය			110 000	01

පාරමීගේ ව්‍යාපාරය (½)
2022.12.31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය

ජංගම නොවන වත්කම්	පිරිවැය	සමුච්චිත ක්ෂය	ධාරණ අගය	(½)
ඉඩම් සහ ගොඩනැගිලි	750 000	75 000	675 000	
රථ වාහන	800 000	240 000	560 000	
ලී බඩු උපකරණ	240 000	24 000	216 000	
	1790 000	339 000	1451 000	01
20% ආයෝජන			300 000	
			1751 000	
<u>ජංගම වත්කම්</u>				
අවසන් තොගය		28 000		
ණය ගැතියෝ		53 000 (½)		
ලැබිය යුතු ආයෝජන ආදායම්		(½) 30 000		
මුදල් ශේෂය		78 000	189 000	
මුළු වත්කම්			1940 000	
2022.01.01 ප්‍රාග්ධනය		1 093000		
එකතු කළා ශුද්ධ ලාභය		110 000		
		1 203000		
අඩු කළා : ගැනිලි		(5 000)	1198 000	
<u>ජංගම නොවන වගකීම්</u>				
12% බැංකු ණය		600 000	600 000	
<u>ජංගම වගකීම්</u>				
ණය හිමියෝ		45 000		
උපචිත බැංකු ණය පොලිය		(½) 72 000		
බැංකු අයිරාව/ බැංකු ශේෂය		(½) 25 000	142 000	
මුළු හිමිකම් හා වගකීම්			1940 000	

LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න